Alcohol and Drug
Information Centre

ADIC

*No.40/18, Park Road, Colombo 5, Sri Lanka.*
*Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484*
*E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk*
*Web Site: http://www.adicsrilanka.org*

සිගරට් බදු වැඩි කිරීම සම්බන්ධව දීප ව්‍යාප්ත මහජන අදහස් විමසීමේ සමීක්ෂණය

සමීක්ෂණ ප්‍රතිඵල පිළිබඳ මාධ්‍ය නිවේදනය - 2021.09.29

**රජයේ ආදායම ඉහළ නැංවීම සඳහා මෙවර අයවැයෙන් සිගරට් බදු වැඩිකල යුතුබව රටේ ජනතාවගෙන් අතිබහුතරයක් වන 89.3%ක් ප්‍රකාශ කර සිටියි.**

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC) 2022 අයවැය තුළින් සිගරට් බදු ඉහළ දැමීම පිළිබඳව ජනතාවගේ අදහස් විමසීම සඳහා සමීක්ෂණයක් සිදුකරන ලදි.


දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක 25 තුළ පිහිටි 331 වන සියලුම ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය කරමින් මෙම සමීක්ෂණය සිදුකරනු ලැබීය.

ඒ ඒ දිස්ත්‍රික්කයන්වල වයස අවුරුදු 20ට වැඩි ජන සංඛ්‍යාව පාදක කරගනිමින් සමීක්ෂණයේ නියැදිය තීරණය කරන ලද අතර මෙම නියැදීකරණයට අනුව පුද්ගලයන් 3958කින් තොරතුරු ලබා ගන්නා ලදි.

2021 සැප්තැම්බර් 15 වෙනිදා සිට 2021 සැප්තැම්බර් 25 වන දින දක්වා විවිධ රැකියාවන්වල නිරත විවිධ සමාජ ස්ථර නියෝජනය වන ආකාරයෙන් ස්ත්‍රී පුරුෂ දෙකොට්ඨාශයෙන්ම සමීක්ෂණ සඳහා තොරතුරු ලබාගන්නා ලදි.


මෙම සමීක්ෂණය සඳහා ස්ත්‍රීන් 981 දෙනෙකු සහ පුරුෂයන් 2977 දෙනෙකුගෙන් තොරතුරු ලබා ගන්නා ලදි.

| | **සංඛ්‍යාව** | **ප්‍රතිශතය** |
|---|---|---|
| ස්ත්‍රී | 981 | 24.8 |
| පුරුෂ | 2977 | 75.2 |
| එකතුව | 3958 | 100.0 |





නියැදියෙන් 21%ක් වයස අවුරුදු 20ත්-24ත් අතර පසුවන්නන්ය. වයස අවුරුදු 25ත්-40ත් අතර ප්‍රමාණය 50%කි. වයස අවුරුදු 40ට වැඩි ප්‍රතිශතය 29% කි.


සමීක්ෂණයට භාජනය වූවන්ගෙන් පිරිමි පුද්ගලයන්ගේ දුම්වැටි භාවිතය පිළිබඳව තොරතුරු විමසා බලන ලද අතර එම පුද්ගලයන්ගෙන් 31% දැනට සිගරට් භාවිත කරන අයයි. 26% දුම්පානය කර භාවිතය නැවැත්වූ පුද්ගලයන් වන අතර 43% ක් කිසිදා දුම්වැටි භාවිත නොකළ පුද්ගලයන් වේ.




රජයේ ආදායම ඉහළ නැංවීම සඳහා රජයට බදු වැඩිකිරීමට සිදු වුවහොත් සිගරට්, ආහාර, විදුලිය සහ ඉන්ධන අතරින් කවර භාණ්ඩයේ බදු ඉහළ නංවනු දැකීමට ඔබ කැමතිද යන ප්‍රශ්නයට සමීක්ෂණයට භාජනයවූවන්ගෙන් 91.5%ක් ප්‍රකාශ කර සිටියේ සිගරට් බදු වැඩි විය යුතු බවයි.





රජය මේ මොහොතේ දැඩි මුල්‍ය අර්බුදයක සිටින බැවින් රජයේ ආදායම වැඩි කර ගැනීම සඳහා සිගරට් බදු වැඩි කරන යෝජනාවක් රජය ඉදිරිපත් කළහොත් එම යෝජනාවට සමීක්ෂණයට භාජනය වුවන්ගේ එකඟතාවය පිළිබඳ විමසා බැලීමේදී සහභාගීවූවන්ගෙන් 89.3%ක් එවැනි යෝජනාවක් ඔවුන් අනුමත කරන බව ප්‍රකාශ කර තිබුණි.




සිගරට් බදු වැඩිකිරීමට එකඟ වූ පුද්ගයන්ගෙන් එසේ සිගරට් මිල වැඩිකිරීමක් සිදු කළහොත් සිගරට්ටුවක මිල කොපමණ ප්‍රමාණයකින් ඉහළ දැමිය යුතුද යන්න පිළිබඳ අදහස් විමසා බලන ලදි. එහිදී 59.1% පවසා සිටියේ සිගරට් මිල රුපියල් 25කට වැඩියෙන් වැඩි කළ යුතු බවයි. රුපියල් 15-25ත් අතර මිලකින් සිගරට් වැඩිවිය යුතු බව 23.7%කින් ප්‍රකාශ කරන ලදී. සමස්ථයක් ලෙස 82.8%ක් ප්‍රකාශකර සිටියේ රුපියල් 15ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් මෙවර අයවැයෙන් සිගරට් මිල වැඩි විය යුතු බවයි.





රජය ආර්ථික අර්බුදයකට මැදිහත් වී ඇති මෙවැනි අවස්ථාවක රජයේ ආර්ථික ශක්තිය වර්ධනය කරගැනීම සඳහා සිගරට් සඳහා වන බදු වැඩි කිරීමක් සිදුකළහොත් ඒ සඳහා සමීක්ෂකයන්ගේ සහාය ලබා දෙනවාද යන ප්‍රශ්නයට සමීක්ෂකයන්ගෙන් 88.4% ක් ප්‍රකාශ කර සිටියේ ඔවුන් ඒ සඳහා තම සහාය ලබා දෙන බවයි.




සිගරට් බදු වැඩිකිරීම තුළින් සිගරට් මිල ඉහල දැමීම සිගරට් භාවිතය අධෛර්යයට පත් කිරීමක් සිදු වෙනවාද යන ප්‍රශ්නයට 76.3%ක් ප්‍රකාශකර සිටියේ එම තත්වය භාවිතය අධෛර්යයමත් කිරීමට හේතුවන බවයි.




සියලු අතවශ්‍ය භාණ්ඩ හා සේවාවල බදු සහ මිල පසුගිය වසර කිහිපය තුළම දිගින් දිගටම වැඩි වුවත්, සිගරට් වැනි අත්‍යවශ්‍ය නොවන භාණ්ඩයක රජය විසින් වසර දෙකක් පුරා සිගරට් බදු වැඩි නොකිරීමට හේතුව කුමක් විය හැකි දැයි විමසා බලන ලදි. එහිදී 52.2% කගේ අදහස වූයේ සිගරට් බදු වැඩිකිරීමට රජය ප්‍රමුඛත්වයක් ලබා නොදෙන බවත් සහ 32.8% ප්‍රකාශ කළේ දුම්කොළ කර්මාන්තය විසින් සිදුකරන බලපෑම් නිසා රජය බදු වැඩිකිරීම් නොකරන බවයි.



සිගරට් බදු වැඩිකිරීම තුළින් සෞඛ්‍ය සේවා නගාසිටුවීමට සහ COVID-සහන ලබා දීම සඳහා කටයුතු කළ යුතු බව සමීක්ෂකයන්ගෙන් 88.5%ක් ප්‍රකාශ කර තිබුණි.




මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමෙන් පෙනීයන්නේ සිගරට් බදු වැඩිකිරීම ජනතාවගෙන් අති බහුතරයක් කැමැත්ත දක්වන බවත් ඒ සඳහා ඔවුන් රජයට සහාය දක්වන බවත්ය.

රටේ මහජනතාව මේ සම්බන්ධයෙන් රජය වහා ක්‍රියාත්මක විය යුතු බව පෙන්වා දෙන අතර, රජය මේ සම්බන්ධයෙන් පුමුඛතාවයක් නොදක්වන බවත්, දුම්කොළ කර්මාන්තයේ බලපෑම්ද දුම්කොළ බදු නිවරදි ආකාරයෙන් වැඩි නොවීමට බලපාන බව මහජනතාවගේ අදහසයි.

මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය වන අපගේ ගණනය කිරීම් වලට අනුව පසුගිය වසර දෙකක කාලය තුළ සිගරට් බදු රුපියල් 20කින් වැඩි කළේනම්, ආසන්න වශයෙන් රජයට රුපියල් බිලියන 100ක පමණ ආදායමක් ලබා ගැනීමේ හැකියාවක් තිබුණි.

රට තුළ පවතින ආර්ථික අර්බුදය හමුවේ තවදුරටත් සිගරට් බදු නියමාකාරයෙන් වැඩි නොකිරීමෙන් රටට සිදුවන පාඩුව වළක්වා ගනිමින්, රජයේ අදායම ඉහළ නංවාගැනීමටත්, ජනතාවට සහන සැලසීමටත්, මෙවර 2021 නොවැම්බර් මස ඉදිරිපත් කිරීමට නියමිත 2022 අයවැය තුළින් සිගරට් බදු අවම වශයෙන් රුපියල් 20ක් වැඩි කර රජයේ බදු ආදායම ඉහළට නැංවීමට කටයුතු කිරීමට රජය ක්‍රියාත්මක විය යුතු බව දුම්බොන්නන් ද ඇතුලුව රටේ බහුතර ජනතාවගේ අදහස බව මෙම සමීක්ෂණයෙන් තහවුරු වේ.


මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය,

නො. 40/18,

උද්‍යාන පාර,

කොළඹ 05

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න - 071 4353248

සම්පත් ද සේරම්